**දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය - 2019**
**-----------------------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය
**-------------------------------**

දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්
**-------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් පිරිමැසුම්දායිව, කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනා ලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 හි 48 ඡේදය ප්‍රකාරව, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතයක් මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටක හැර ආදායම් හා වියදම් හිලව් නොකළ යුතුය. එසේ වුවද රු.104,650 ක් වූ පුවත්පත් දැන්වීම් පළ කිරීමේ වියදම ආපසු නොගෙවන තැන්පත් ආදායමට එරෙහිව හිලව් කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | දැනට මෙම කරුණ පිළිබඳව සලකා බලා ඇති අතර ඉදිරියේදී ප්‍රමිතය ප්‍රකාරව ක්‍රියා කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන බව. | ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. 2020 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙම වරද නිවැරදි කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 හි 47 ඡේදය ප්‍රකාරව, ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේද වැරදි ඒවා සොයා ගැනීමෙන් පසුව නිකුත් කිරීම සඳහා අනුමත කරන පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි, වරද සිදු වූ කාලච්ඡේදය සඳහා ඉදිරිපත් කර ඇති සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමෙන් | ඉදිරියේදී ප්‍රමිතිය ප්‍රකාරව ක්‍රියාකිරීමට අවශ්‍ය පියවර ගනු ලබන බව | ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. 2020 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙම වරද නිවැරදි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අතීතානුයෝගීව නිවැරදි කළ යුතුය. නමුත් 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් හා Smokeless Tobacco Bloomberg (STB) ව්‍යාපෘතියෙන් අධිකාරිය වෙත ලැබී තිබුණු රු.මිලියන 32.88 ක් හා ඉන් වැය කර තිබුණු රු.මිලියන 24.65 ක් ඒ ඒ වර්ෂවලදී ගිණුම්ගත කර නොතිබීමේ වරද අතීතානුයෝගීව නිවැරදි කර නොතිබුණු අතර ඒ වෙනුවට සමුච්චිත ලාභයට ගළපා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි. තවද ඉකුත් වර්ෂයේ ආදායමක් ලෙස හඳුනාගත යුතුව තිබුණු රු.129,323 ක් 2018 දෙසැම්බර් 31 දිනට ණයහිමියන් ලෙස හඳුනාගෙන තිබීමේ වරද සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කිරීමේදී සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමෙන් නිවැරදි කර නොතිබුණි. | | |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 14 ප්‍රකාරව, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වෙනත් පුද්ගලික හා රජයේ ආයතනවල දරන නිලතල හා සම්බන්ධිත පාර්ශවයන් සමඟ සිදුකරන ලද ගනුදෙනු පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | 2020 වර්ෂයේදී පත් කරන ලද නව අධ්‍යක්ෂ මණ්ඩලයෙන් මෙම තොරතුරු ලබා ගැනීම සඳහා දැනටමත් කටයුතු කර ඇති බව හා ඉදිරියේදී පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශනයන්හි, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වෙනත් පුද්ගලික හා රජයේ ආයතනවල දරන නිලතල හා සම්බන්ධිත පාර්ශවයන් සමඟ සිදුකරන ලද ගනුදෙනු පිළිබඳ හෙළිදරව් කිරීමට කටයුතු කරන බව | -එම- |
| (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19 ප්‍රකාරව, සේවකයින්ගේ පාරිතෝෂික ගෙවීම් වෙනුවෙන් වත්කමක් ඇති කිරීමට, ආයුගණකවරයෙක් මගින් අනාගතයේදී සේවකයන්ට ගෙවීමට වන පාරිතෝෂිකවල වර්තමාන අගය ගණනය කිරීමට හා එම අගය වත්කමේ සාධාරණ අගය සමඟ සසඳා ආයුගණන ලාභ හා අලාභ ඇත්නම් එම ප්‍රමාණය ගිණුම්වල හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පාරිතෝෂික සඳහා වෙන් කිරීමක් කර ඇති අතර, ආයුගණකවරයෙක් මගින් අනාගතයේදී සේවකයන්ට ගෙවීමට සිදුවන පාරිතෝෂිකවල වර්තමාන අගය ගණනය කර අවශ්‍ය විධිවිධානයන් යෙදීමට පියවර ගනු ලබන බව | -එම- |

## 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දින වන විට ගෙවිය යුතුව පැවති ඉකුත් වර්ෂ තුනක් සඳහා වූ රු.මිලියන 2.48 ක විගණන ගාස්තු සඳහා වෙන්කිරීමක් සිදුකර නොතිබුණ අතර සමාලෝචිත වර්ෂය සඳහාද වෙන් කිරීමක් කර නොතිබුණි. | 2016 වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු විගණන ගාස්තුවෙහි යම්කිසි සංශෝධනයක් හෝ නැතහොත් එම මුදල ගෙවීමට සිදු වන්නේ නම් ඒ සඳහා සහනදායී කාලයක් ලබා ගැනීමට අධිකාරිය විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් කරන ලද ඉල්ලීම අනුව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් එම ඉල්ලීම විගණකාධිපතිට යොමු කර ඇති බැවින් හා 2016 විගණන ගාස්තු සම්බන්ධව හෝ ඉන්පසු වර්ෂයන් සඳහා විගණන ගාස්තු අය කර ගැනීම සඳහා විගණනයෙන් ඉන්වොයිස් ලබා දීමක් කර නොතිබුණු බැවින් විගණන ගාස්තු සඳහා වෙන් කිරිමක් සිදු නොකළ බව | විගණන ගාස්තු සම්බන්ධයෙන් කරන ලද ඉල්ලීමට පිළිතුරු ලැබෙන තෙක් 2016 වර්ෂයේ විගණන ගාස්තු සඳහා නිකුත් කර ඇති ඉන්වොයිස් අනුව ගෙවීම් කළ යුතු අතර පසුව එළඹෙන වර්ෂ සඳහා 2016 වර්ෂයේ විගණන ගාස්තු පදනම්ව ප්‍රතිපාදන වෙන් කළ යුතුය. මේ සම්බන්ධයෙන් 1971 අංක 38 දරන මුදල් පනතේ 13(2) වගන්තිය කෙරෙහි අවධානය යොමු කළ යුතුය. 2020 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙම වරද නිවැරදි කළ යුතුය. |
| (ආ) | මුළු පිරිවැය රු.මිලියන 2.99 ක් වූ ශ්‍රව්‍ය හා දෘෂ්‍ය වීඩියෝපට දේපල, පිරියත හා උපකරණ යටතේ හඳුනා ගෙන තිබීමේ වරද නිවැරදි කරමින් සමාලෝචිත වර්ෂයේදී එම වත්කම් අස්පෘෂ්‍ය වත්කම් ලෙස හඳුනාගෙන තිබුණි. නමුත් එම අස්පෘෂ්‍ය වත්කම්වල සාධාරණ අගය තක්සේරු කර හෙළිදරව් කිරීමට කටයුතු නොකර ඒ වෙනුවට දේපල, පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂය ගිණුමේ පැවති ශේෂය රු.මිලියන 1.15 ක් අස්පෘෂ්‍ය වත්කම් ක්ෂය වෙන් කිරීමේ ගිණුමට මාරු කර තිබුණි. | ඉදිරියේදී පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශනයන්හි, විගණනය විසින් සිදුකළ දැනුවත් කිරීම් හා උපදෙස් අනුව අදාළ ගැලපීම් සිදු කරන බව | 2020 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙම වරද නිවැරදි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2018 දෙසැම්බර් 31 දින වන විට Smokeless Tobacco Bloomberg (STB) ව්‍යාපෘතියෙන් ලැබී තිබුණු රු.මිලියන 18.32 ක් ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට බැර කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී ඉන් රු.මිලියන 3.16 ක් පුනරාවර්තන වියදම් සඳහා වැයකර තිබුණු නමුත් ඊට සමාන අගයක් පුනරාවර්තන ආදායමක් ලෙස හඳුනාගෙන නොතිබීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි. | ඉදිරියේදී පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශනයන්හි, විගණනය විසින් සිදුකළ දැනුවත් කිරීම් හා උපදෙස් අනුව අදාළ ගැලපීම් සිදු කරන බව | 2020 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙම වරද නිවැරදි කළ යුතුය. |

### 1.5.4 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| | අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නිපුණතාවයෙන් හා දයානුකම්පාවෙන් ප්‍රශස්ථ රෝගී සත්කාර ලබා දෙන ස්වයං තෘප්තිමත් අභ්‍යන්තර වෛද්‍ය නිලධාරීන් බිහිකිරීම තුළින් වෛද්‍ය ප්‍රතිකාරවල ගුණාත්මකභාවය සහ ආරක්ෂාව වැඩිදියුණු කිරීමේ අපේක්ෂාවෙන් සෞඛ්‍ය පර්යේෂණ සහ නවෝත්පාදන භාර අරමුදල විසින් සීමාවාසික වෛද්‍යවරුන් සඳහා පැවැත්වීමට යෝජිතව තිබුණු වැඩසටහනක් සඳහා පොත් මුද්‍රණය කර දෙන මෙන් අධිකාරියෙන් ඉල්ලීමක් කර තිබුණි. එම වැඩසටහන අධිකාරියේ අරමුණු යටතට ගත නොහැකි වැඩසටහනක් විය. නමුත් එහි නම "දුම්කොළ හා මද්‍යසාර වැළැක්වීම සහ පාලනය කිරීම පිළිබඳ වෛද්‍ය සීමාවාසිකයින්ගේ ධාරිතා වර්ධනය කිරීමේ වැඩසටහන" ලෙස වෙනස් කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් අධිකාරිය වෙත ලබාදී තිබුණු අරමුදල්වලින් රු.739,446 ක් වැයකර පවත්වා තිබුණි. | අධිකාරියේ අරමුණු හා බැඳුනු යෝජනා ඇතුළත්ව ඉදිරිපත් කරන ලද ලිපියේ කරුණු සලකා බලා අදාළ කටයුත්ත වෙනුවෙන් සහයෝගය ලබා දුන් බව, වැඩසටහනේ නම වෙනස් කර නොමැති බව, වැඩසටහන සඳහා අධිකාරියේ සම්පත්දායකයින්ගේ දේශන සහ සහභාගිත්වය සිදුවී ඇති බව, ඉදිරියේ දී අධිකාරියේ සහයෝගය බලාපොරොත්තුවෙන් කරනු ලබන මෙවැනි වැඩසටහන්වලදී අධිකාරියේ අරමුණු හා සෘජුව සම්බන්ධ වන කටයුතුවලට පමණක් අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබාගෙන සහයෝගය ලබා දෙන බව | අධිකාරියේ අරමුණු යටතට ගැනෙන හා අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව අනුමැතිය සහිත වැඩසටහන් පමණක් ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2018 දෙසැම්බර් 31 දින වන විට Smokeless Tobacco Bloomberg (STB) ව්‍යාපෘතියෙන් ලැබී තිබුණු මුළු මුදල රු.මිලියන 18.32 ක් වූ අතර ක්‍රියාත්මක කිරීම සඳහා අරමුණු 3 ක් හඳුනාගෙන තිබුණි. එම අරමුණු 3 වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී වැය කර තිබුණු මුදල රු.357,717 ක් පමණක් විය. නමුත් එම අරමුණුවලින් බැහැරව හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව විවිධ රාජ්‍ය මෙන්ම පෞද්ගලික ආයතන හා සංවිධාන විසින් පවත්වා තිබුණු වැඩසටහන් වෙනුවෙන් රු.572,260 ක් වැය කර තිබුණි. තවද ව්‍යාපෘතියෙන් ලැබී තිබුණු මුළු මුදලින් සියයට 17 ක් පමණක් කාර්යය මණ්ඩල වැටුප් හා දීමනා වශයෙන් ගෙවිය හැකි වුවද, ඉන් සියයට 38 කට සමාන රු.මිලියන 7.03 ක් ඒ වෙනුවෙන් වැය කර තිබුණි. | අධිකාරිය විසින් කර්තව්‍යයන් ඉටු කිරීමේදී අයවැය ගත අරමුණු හා සම්බන්ධව වියදම් දැරීමට කටයුතු සම්පාදනය කරනු ලබන බව හා රාජ්‍ය මෙන්ම පෞද්ගලික ආයතනවලින් අධිකාරියේ සහයෝගය ලබාගැනීම වෙනුවෙන් කරනු ලබන ඉල්ලීම්වලදී අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට යොමු කිරීමටත් ඔවුන්ගේ අනුමැතිය ලබා ගැනීමටත් කටයුතු කරන බව | අධිකාරියේ අරමුණු යටතට ගැනෙන හා අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව අනුමැතිය සහිත වැඩසටහන් පමණක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) | භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව හා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත පමණක් Smokeless Tobacco ව්‍යාපෘතියේ ගිණුම් නඩත්තු කිරීම වෙනුවෙන් 2016 ජූලි මාසයේ සිට මාසයකට රු.10,000 බැගින් මාස 37 ක් සඳහා රු.370,000 ක් අධිකාරියේ ගණකාධිකාරිවරයා වෙත ගෙවා තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව මෙවැනි දීමනා නොගෙවිය යුතුය. |

**1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සඳහා වැඩමුළුවක් පැවැත්වීම හා මතින් මිදුණු මත් ලෝලියෙකුගේ අත්දැකීම් ඇසුරින් වීඩියෝ පිටපතක් පිළියෙල කිරීම සඳහා නිසි කළමනාකරණයෙන් තොරව වැය කර තිබුණු මුළු මුදල රු.67,525 ක් සනාථ කර ගැනීමට අවශ්‍ය ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි. | අධිකාරිය විසින් වැඩසටහනක් පැවැත්වීමට පෙර, සහභාගීවන්නන්ගේ පැමිණීම පිළිබඳ තහවුරුවක් දුරකථන මාර්ගයෙන් හෝ ලිඛිව ලබා ගැනීම සිදු කරන නමුත් කාර්යය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම මත මෙම වැඩසටහන කළමනාකරණය සිදු වී නොමැති බව, ඉදිරියේදී පවත්වනු ලබන වැඩසටහන්වලදී අධිකාරියේ දැඩි අවධානය ඒ සඳහා යොමු කිරීමට කටයුතු කරනු ලබන | වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී හා ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත් ඉටුකිරීමේදී නිසි කළමනාකරණයකින් යුතුව කටයුතු කළ යුතු අතර සෑම ගෙවීමක්ම ලිඛිත සාක්ෂි මඟින් සනාථ කළ යුතුය. |

බව හා මතින් මිදුණු මත් ලෝලියකුයකුගේ අත්දැකීම් ඇසුරින් පිළියෙල කළ වීඩියෝ පටයේ යම් යම් වෙනස් කිරීම් ගෙවීම් කිරීමේදී සැලකිල්ලට ගෙන නොමැති බව හා ඉදිරියේ දී ගිවිසුම් ප්‍රකාරව කටයුතු කරන බව.

## 1.6 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික පනත | | | |
| (i) 3(1) (ආ) වගන්තිය | අධිකාරියේ පාලක මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස අධිකරණ අමාත්‍යාංශයේ ජ්‍යෝෂ්ඨ ලේකම්වරයෙකුට ඉහළ තනතුරක් දරන අයෙක් පත්කළ යුතු වුවද, 2020 මාර්තු 11 දින වන විටත් එම සාමාජිකයා පත්කර නොතිබුණි. | කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස අධිකරණ අමාත්‍යාංශයේ ජ්‍යෝෂ්ඨ ලේකම්වරයෙකුට ඉහළ තනතුරක් දරන අයෙක් පත්කිරීමට කටයුතු කරන මෙන් අදාළ අංශයන්ගෙන් ඉල්ලීම් කළ බව | පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) 22(2) වගන්තිය | අධිකාරිය වෙත ඒකාබද්ධ අරමුදලින්, ශ්‍රී ලංකාව තුළින් හා ඉන් පිටතින් ත්‍යාග, ප්‍රදාන හෝ පරිත්‍යාග වශයෙන් ලැබෙන සියළු මුදල් අධිකාරිය නමින් වූ අරමුදලට බැර කරනු ලැබිය යුතු වුවද, 2019 දෙසැම්බර් 31 දින වන විට ඒකාබද්ධ අරමුදලින් හා විදේශ ප්‍රදාන වශයෙන් ලැබී තිබුණු රු.මිලියන 20.17 ක් අධිකාරිය නමින් වූ අරමුදලට බැර කර නොතිබුණු අතර ඒ වෙනුවට ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට බැර කර තිබුණි. | ඉදිරියේදී අධිකාරිය වෙත ඒකාබද්ධ අරමුදලින්, ශ්‍රී ලංකාව තුළින් හා ඉන් පිටතින් ත්‍යාග ප්‍රදාන හෝ පරිත්‍යාග වශයෙන් ලැබෙන සියළු මුදල් අධිකාරියේ අරමුදලට බැර කිරීමට අවශ්‍ය කටයුතු කරන බව | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 625(3) හා 2019 ජුලි 25 දිනැති අංක SC&PMU/Grant/19 දරන විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කර තිබුණු ලිපිය | ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ලබාදී තිබුණු රු.මිලියන 8.23 ක් වූ ප්‍රදාන විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා එම දෙපාර්තමේන්තුවේ අනුදැනුම මත ලබා ගෙන නොතිබුණි. | ඉදිරියේදී අධිකාරිය වෙත ලැබෙන විදේශ ප්‍රදාන භාණ්ඩාගාරයේ තැන්පත් කර මුදල් රෙගුලාසි අනුව කටයුතු කරන බව | මුදල් රෙගුලාසි හා අදාළ අනෙකුත් විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2015 සැප්තැම්බර් 15 දිනැති අංක SP/SB/07/15 දරන ජනාධිපති කාර්යාල චක්‍රලේඛය | අධික පිරිවැයක් සහිත සුපිරි ගණයේ හෝටල්වල රාජ්‍ය උත්සව සම්මන්ත්‍රණ හා වැඩමුළු නොපැවැත්විය යුතු වුවද, එම චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව කටයුතු කරමින් සුපිරි ගණයේ හෝටල්වල වැඩමුළු හා සම්මන්ත්‍රණ පැවැත්වීම සඳහා රු.මිලියන 1.66 ක් වැය කර තිබුණි. | ඉදිරියේදී පවත්වනු ලබන රාජ්‍ය උත්සව, සම්මන්ත්‍රණ හා වැඩමුළු, අදාළ ජනාධිපති චක්‍රලේඛ විධිවිධානවලට අනුව අධික පිරිවැයක් සහිත සුපිරි හෝටල්වල නොපැවැත්වීමට කටයුතු කරන බව | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය<br>------------------------------ | | | |
| | (i) 5.2.3 වගන්තිය | 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අයවැයගත ආදායම් හා වියදම් ප්‍රකාශනය, එදිනට අයවැයගත මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා ශේෂ පත්‍රය සහිතව සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනය පිළියෙල කළ යුතු වුවද, චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවන ලෙස අයවැය ලේඛනය පිළියෙල කර තිබුණි. | පසුගිය වර්ෂ කිහිපයක සිට ගිණුම් අංශයේ සියලුම කටයුතු ගණකාධිකාරීවරිය විසින් සිදු කිරීම නිසා රාජකාරී කටයුතු ඉටු කිරීමට ප්‍රමාණවත් කාලයක් නොතිබුණු බව හා ඉදිරියේදී අවශ්‍ය නිලධාරීන් බඳවා ගෙන චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂය සඳහා අවශ්‍යවන අයවැය ගත ලේඛන සකස් කිරීමටත් ඉදිරිපත් කිරීමටත් අවශ්‍ය කටයුතු යොදන බව | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) 6.5.1 වගන්තිය | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ අධිකාරියේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | සාමාන්‍යාධිකාරී තනතුර පුරප්පාඩුව පැවතීම මීට හේතුවූ බව, එම තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු බඳවා ගැනීමට කටයුතු යොදා ඇති බව හා ඉදිරියේදී ප්‍රමාදයකින් තොරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරන බව | -එම- |
| (ඉ) | 2015 මැයි 25 දිනැති අංක පීඊඩී/1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.5 ඡේදය | ප්‍රවාහන හා ඉන්ධන දීමනා ලබාගන්නා නිලධාරීන් සංචිත වාහන හෝ වෙනත් කාර්යාලීය වාහන පාවිච්චි නොකළ යුතු වුවද, අධිකාරියේ සභාපති විසින් ප්‍රවාහන හා ඉන්ධන දීමනාව ලබා ගන්නා අතරතුර රාජකාරි කටයුතු සහ නිවසට යාම ඒම සඳහා අධිකාරිය සතු වාහන පාවිච්චි කර තිබුණි. | නොවැලැක්විය හැකි හේතුන් මත පෞද්ගලික වාහනය යොදාගැනීමට නොහැකි වූ අවස්ථාවලදී රජයේ වාහන භාවිතා කර ඇති බව හා ඉදිරියේදී ප්‍රවාහන හා ඉන්ධන දීමනා ලබා ගන්නා නිලධාරීන් වෙත රජයේ වාහන ලබා නොදීමට කටයුතු කරන බව | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මට, යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්යය මණ්ඩලය සහ දැනට සිටින කාර්යය මණ්ඩල පිළිබඳ විස්තර, අයවැය ලේඛනය, ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම, අක්මුදල් අවශ්‍යතා සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුළත් කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලස්ම අනුමත කාර්යය මණ්ඩලය සහ දැනට සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර, අයවැය ලේඛනය, ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ජාතික අය වැය දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය අනුමැතීන් සඳහා වර්ෂය මුලදී ඉදිරිපත් කරන බව හා අදාළ රාජ්‍ය | -එම- |

| | | |
|---|---|---|
| | | මුදල් චක්‍රලේඛය අනුව ඉදිරි වර්ෂයන්හි තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.472,998 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.11,581 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.484,579 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සේවක වැටුප් වැඩිවීම හා වැඩසටහන් සඳහා දරන ලද වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දුම්කොළවලට ඇබ්බැහි වූවන්ට එයින් අත්මිදවීම සඳහා උපකාර කිරීමේ අරමුණින් 2017 වර්ෂයේදී ආරම්භ කර තිබුණු “1948 දුම්කොළ හා මද්‍යසාර උපදේශන සේවාව” සඳහා 2020 ජුලි 31 දින වන විට රු.මිලියන 5.39 ක් වැයකර තිබුණු අතර එම සේවාව වරින් වර අක්‍රීය වීම නිසා නොකඩවා සේවාව සැපයීමට නොහැකි වී තිබුණි. පද්ධතියේ අක්‍රීය වීම, තාක්ෂණික නඩත්තුවට අදාළ සේවා ගිවිසුම යාවත්කාලීන නොකිරීම, ප්‍රාග්ධන මූල්‍ය හිඟතාවය හා උපදේශකයින් වරින් වර සේවයෙන් ඉවත් වීම ආදී හේතු මෙම සේවාව අක්‍රීය විමට බලපා තිබුණි. | පද්ධතියේ අක්‍රීය වීම, තාක්ෂණික නඩත්තුවට අදාළ සේවා ගිවිසුම යාවත්කාලීන නොකිරීම, ප්‍රාග්ධන මූල්‍ය හිඟතාවය හා උපදේශකයින් වරින් වර සේවයෙන් ඉවත් වීම ආදී හේතු මෙම සේවාව අක්‍රීය විමට බලපා ඇති බව හා ඉදිරියේදී උපදේශන සේවාව යාවත්කාලීනව පවත්වා ගෙන යාමට කටයුතු කරන බව | උපදේශන සේවාව ඵලදායීව යොදා ගත හැකිද යන්න පිළිබඳ අධ්‍යයනයකින් පසුව එම සේවාව සක්‍රීය කළ යුතුය. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරිය විසින් තම කාර්යභාරය ඉටුකිරීම සඳහා තනතුරු 30 ක් සහිත කාර්ය මණ්ඩලයක අවශ්‍යතාවය හඳුනාගෙන තිබුණු නමුත්, 2019 දෙසැම්බර් 31 දින වන විට ඉන් තනතුරු 14 ක් සඳහා පමණක් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී තිබුණි. කෙසේ වෙතත් 2019 දෙසැම්බර් 31 දින වන විට තථ්‍ය කාර්ය මණ්ඩලය 11 දෙනෙකුගෙන් පමණක් සමන්විත වූ අතර ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැතිවීම අධිකාරිය සතු කර්තව්‍යයන් නිසි පරිදි ඉටුකිරීමට බාධාවක් වී තිබුණි. 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ වර්ෂ 04 තුළදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී නොතිබුණු තනතුරු සඳහා වරින්වර බඳවා ගෙන තිබුණු කාර්යය මණ්ඩලයේ 35 දෙනෙකු වෙත රු.මිලියන 12.31 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. | අධිකාරියේ බොහෝ කර්තව්‍යයන් නිසි පරිදි ඉටුකිරීමට අධිකාරිය තුළ ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති බව, නව අධ්‍යක්ෂක මණ්ඩලයේ උපදෙස් හා මඟපෙන්වීම යටතේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලද තනතුරු ඉතා ඉක්මනින් බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව හා ඉදිරියේදී සේවක මණ්ඩල අනුමත කරවා ගැනීමට හා බඳවා ගැනීම් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය යටතේ පමණක් සිදු කරන බව | අධිකාරියේ අරමුණු හා කාර්යයන් ඉටු කර ගැනීම සඳහා ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් විධිමත් පරිදි අනුමත කරවා ගැනීමට හා බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |

**4. ශිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැසුම්වල ඇතුළත් කර තිබුණු දුම්කොළ හා මද්‍යසාර බඳුකරණය පිළිබඳ සූත්‍රයක් පිළියෙල කිරීම, රේගු හා සුරාබදු නිලධාරීන් වැනි පනත ක්‍රියාත්මක කරන නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, චිත්‍රාත්මක අවවාදයන් ක්‍රියාත්මක | ඉදිරි වර්ෂවලදී මද්‍යසාර බදු සඳහා සූත්‍රයක් සකස් කිරීමට හා සුරාබදු නිළධාරීන් සඳහා වැඩසටහන් පැවැත්වීමට නියමිත බව, රූපමය සෞඛ්‍ය අවවාද ක්‍රියාත්මකවීම පිළිබඳව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු හරහා කාර්තුමය වශයෙන් වාර්තා ලබා ගන්නා බව හා එලෙස ලබා ගන්නා වූ තොරතුරු පදනම්ව ප්‍රගතිය | අධිකාරිය සතු භෞතික හා මානව සම්පත් මත පදනම්ව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු අතර සැලසුම් කළ පරිදි කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කිරීම පිළිබඳ වාර්තා කිරීම, වාර්ෂික වාර්තාවක් ප්‍රසිද්ධ කිරීම, මාධ්‍ය ප්‍රතිපත්තීන් කඩකරන්නන් හට නෛතික ක්‍රියාමාර්ග ගැනීම හා තනි දුම්වැටි පිළිබඳ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම යන ක්‍රියාකාරකම් 06 ක් 2020 ජුලි 28 දින වන විටත් ඉටුකිරීමට අපොහොසත් වී තිබුණි. | සමාලෝචනය කරමින් කටයුතු කිරිම අවශ්‍ය වුවද කාර්ය මණ්ඩලයේ හිඟකම නිසා එලෙස කටයුතු කිරීමට නොහැකි වූ බව. | |
| (ආ | සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ප්‍රගති වාර්තාවල මූල්‍ය ප්‍රගතිය පමණක් දක්වා තිබුණු අතර භෞතික ප්‍රගතිය දක්වා නොතිබුණි. | ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැතිවීම නිසා භෞතික ප්‍රගතිය වාර්තා කිරීමට නොහැකි වූ බව, විශේෂයෙන්ම සාමාන්‍යාධිකාරී තනතුර පුරප්පාඩුවීම හේතුවෙන් අවශ්‍ය මඟ පෙන්වීම් හා උපදෙස් ලබා දෙමින් ප්‍රගතිය සමාලෝචනය කළ නොහැකි වූ බව හා ඉදිරියේදී අත්‍යවශ්‍ය අවම සේවක සංඛ්‍යාව හෝ බඳවා ගනිමින් අධිකාරියේ කටයුතු විධිමත්ව සිදු කිරීමට පාලනාධිකාරියේ විශේෂ අවධානය යොමු වී ඇති බව | කාර්යසාධන වාර්තාවල මූල්‍ය හා භෞතික ප්‍රගතිය දැක්විය යුතුය. |

**4.2** අභ්‍යන්තර විගණනය
------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ය සඳහා අධිකාරියේ කටයුතු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | 2018 වර්ෂයෙන් පසුව අභ්‍යන්තර විගණනයක් සිදුකර නොමැති බව හා 2020 ජුලි 13 දින සෞඛ්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් අභ්‍යන්තර විගණනයක් කර ගැනීම සඳහා ලිඛිත ඉල්ලීමක් කර ඇති බව | අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුය. |

**4.3 විගණන කමිටු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන යහපාලනය පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය අනුව වර්ෂයක් තුළදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 4 ක් පැවත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා එක් රැස්වීමක් පමණක් පවත්වා තිබුණි. | කමිටුව සඳහා පත්කර තිබුණු නිලධාරීන් විශ්‍රාම යාම හා 2019 ඔක්තෝබර් මාසයෙන් පසුව අධ්‍යක්ෂ මණ්ඩලය විසිරුවා හැරීම නිසා කමිටු පැවත්වීමට නොහැකි වූ බව, ප්‍රවර්තන වර්ෂය වෙනුවෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව කමිටු සාමාජිකයන් පත් කරවා ගැනීමට කටයුතු යොදා ඇති බව හා ඉදිරියේදී චක්‍රලේඛ අනුව කමිටු පැවත්වීමට කටයුතු කරන බව | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය. |